**ශීර්ෂ 318 - ඌව පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

ඌව අභියෝගයෙන් අභිමානයට

**1.2 මෙහෙවර**

ඌව පළාත තුළ පවත්නා හා බාහිර වශයෙන් ලබාගන්නා සීමිත සම්පත් ප්‍රශස්ථ ලෙස යොදවා ඌව පළාතේ ජනතාවගේ ආර්ථික, සමාජීය,ශාරීරික හා මානසික සංවර්ධනය ඇති කරලීම තුළින් ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම හා අන්‍යෝන්‍ය විශ්වාසය හා සාමකාමී බව ප්‍රවර්ධනය කිරීම ඌව පළාත් සභාවේ මෙහෙවර වේ.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

ඌව පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.19,380,202,600 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.16,432,566,145 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.2,947,636,455 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 14,744,152,000 | 12,500,152,000 | 2,244,000,000 | 15 |
| මූලධන | 4,636,050,600 | 3,932,414,145 | 703,636,455 | 15 |
| එකතුව | 19,380,202,600 | 16,432,566,145 | 2,947,636,455 | 15 |

මධ්‍යම රජය විසින් ලබාදී තිබුණු ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ උපයෝජනය කර තිබුණු අතර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.